සන්නස
නව සහශ්‍රයට
SANNASA

සංස්කරණය/**Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva
තාක්ෂණ සහය
දසුන් ගජමන් Dasun Gajaman

සන්නස පිරිවර
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්ද්‍රි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
සාමන්ත තැන්නගේ
Page Layout & Graphic Designs
Saamantha Tennege

සම්බන්ධීකරණය

| NSW | WA |
|---|---|
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananada Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nattle Drive
Hallam Vic 3803 Australia

Web: www.sannasa.net
email : info@sannasa.net
sannasa@gmail.com

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## බැලීම සහ කියවීම

විදෙස් ගත ශ්‍රී ලාංකිකයන් අතින් බොහෝ ජනමාධ්‍ය ද නාට්‍ය ගීත ඇතුළු කලා නිර්මාණ ද බිහිවුවත් ඔවුන් එම කාර්යයේ නිරත වන්නේ නිවැරදි දෘෂ්ඨියකින් නොවේ. එනිසාම එම නිර්මාණ දෘෂ්ඨිමය ඌණතාවෙන් පෙළෙණු අපි දකිමු. බොහෝ නිර්මාණකරුවන්ගේ අරමුණ හුදු ප්‍රචාරක හා ආර්ථික ඉලක්කයනට සීමා වීම තුළ තමන්ගේ අදහස් නිවැරදි දැක්මක් තුළින් සමාජගත කොට ජනතාව හා සංවාදයකට ඇති ඉඩ කඩ අහුරා ගනිමින් සිටිති. කොපමණ නව පුවත්පත් සඟරා බිහිවුව ද මේ සංවාද රික්තය නොපිරී පවතින්නේ එනිසා ය. මෙයට තුන් වසරකට පෙර මෙම ඌණතාව හීන කිරීමේ සද් අරමුණෙන් අපි මාධ්‍යමය ගමනක් ඇරඹුවෙමු. වසර තුනක් පුරා ආ දුෂ්කර ගමනක සිව්වැනි සන්ධිස්ථානය කරා දැන් අපි ළඟා වී සිටිමු.

මේ ගමන ආරම්භයේදී අපට අරමුණු කීපයක්ම තිබුණි. ඉන් මූලික වූයේ ඕස්ට්‍රේලියාව තුළ පත්තර බලන ජන සමාජය පත්තර කියවන ජන සමාජයක් බවට පත් කර ගැනීමේ ඉලක්කයයි. මතු පිටින් සරල සේ පෙනුණ ද බැලීම හා කියවීම අතර වෙනස විශාල ය. වත්මනෙහි සන්නිවේදන තාක්ෂණයේ ඇති දියුණුව නිසා තොරතුරු ජනතාව වෙත සීඝ්‍රයෙන් ගලා යයි. ඊට සමගාමීව ජනතාවගේ එදිනෙදා ජීවන රටාවද වේගවත් වීම නිසා ඇසීම බැලීම හැර ඉන් ඉදිරියට යාමට සමාජයට කාලය අහිමි වී තිබේ. "කියවීම මිනිසා පූර්ණත්වයට පත් කරයි" යන්න ආප්තෝපදේශයක් පමණක් ව තිබේ. ශ්‍රී ලංකාවෙන් පිටත ලාංකිකයන් වැඩියෙන්ම ජීවත් වන මෙල්බන්හි ජනතාවගේ සති අන්ත ජාතික පුවත්පත් රුචිය පිලිබඳව අප කළ සමීක්ෂණයකදී එය ප්‍රායෝගිකව ඔප්පු විය.

අප උත්සාහ දරමින් සිටින්නේ අපේ සමාජය යලිත් කියවන මිනිසුන් සිටින සමාජයක් බවට පත් කරගැනීම සඳහා ය. මෙය අසීරු ඉලක්කයක් බව ද අපි දන්නෙමු. අපේ උරුමයේ සිට නව සහස්‍රය කරා යන මේ ගමන යළි ආපසු හැරවීමට අපට අදහසක් නැත. වරෙක 'ගතේ' කීවාක් මෙන් 'එක්කෝ අප නැගී සිටිය යුතු ය. නැත්නම් වැටිය යුතු ය. එක්කෝ අප පාලනය කර ජය ගත යුතු ය. නැත්නම් අප සේවය කර පරාජය විය යුතු ය. එක්කෝ අප පීඩාවට පත් විය යුතු ය. නැත්නම් අප සාර්ථක විය යුතු ය. එක්කෝ අප කිණිහිරය විය යුතු ය. නැත්නම් මිටිය විය යුතු ය.

අපි එක්ව ඉදිරියට යමු. සැමට සුබ නව වසරක්..

අසෝක සුබසිංහ
සංස්කාරක

# 'පනස් හයේ විප්ලවයේ' දරුවකු නොවූ

### අනුර බණ්ඩාරනායකයන්ගේ සමුගැන්ම වෙනුවෙනි




# අනුර

ප්‍රගීත් එක්නැලිගොඩ විසිනි
අනුග්‍රහය - 'ලංකා ඊ නිව්ස්'

ජාතික උරුම ගරු අමාත්‍ය අනුර බණ්ඩාරනායක මහතා, ටික දිනක් තිස්සේ අසනීපයෙන් සිට, ඒ මහතාගේ නිල නිවසේදී පසුගිය 16 වන ඉරිදා සවස අවසන් සුසුම් හෙලුවේය. මිය යනවිට ඒ මහතා පනස් නව වැනි වියේ පසුවිය. එතුමාගේ අකල් මරණයෙන් ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුවට විශිෂ්ටතම පාර්ලිමේන්තු මංත්‍රීවරයකු ද පොදුවේ රටට මහත්මා ගුණයෙන් යුතු දේශපාලනඥයකු ද දේශපාලන සමාජයට ප්‍රියජනක අවංක බහුශ්‍රැත සාමාජිකයකු ද ඔහුගේ මිතුරන්ට ආශ්වාද ජනක සගයකු ද අහිමිවිය.

**ඔහු ඇති තරම් විශ්ව කලාවම රස වින්දේය. එහෙත් තම ජන සමාජයේ අඳුරු මුලු ගැන සොයා බැලීමට ඔහු වෙහෙස වූ බවක් පෙනෙන්නේ නැත. එය කුමාරයෙකු විසින් පැහැරහැරිය නො යුතුව තිබූ අභ්‍යාසයකි. එසේ ද වුවත්, අනුර බණ්ඩාරනායක මහතා, ශ්‍රී ල නි ප ය තුළින් බිහිවූ විශිෂ්ටතමයා බවට සැකයක් නැත. එ නමුත් ශ්‍රී ල නි ප ය විසින් එලෙස ඔහු ඇගයුනාදැයි කියන්නට නුපුළුවන. ඉතිහාසය විසින් ඔහුට ලබාදුන් අවකාශය ගැන සලකා බලද්දී, ඔහුගේ අකල් මරණය, ඔහුට සහනයක් වූවා විය හැකි වුවත්, ශ්‍රී ල නි ප ය ට කිසිදු දිනෙක ඔහුගේ අභාවයෙන් ඇති වූ හිදැස පියවන්නට නොහැකිය.**

1966 දී කොළඹ රාජකීය විද්‍යාලයෙන් සිය මූලික අධ්‍යාපනය ආරම්භ කොට, 1970 දී උසස් අධ්‍යාපනය සඳහා ඔහු එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් සරසවියට ඇතුළු විය. එහිදී ඉතිහාසය හා දේශපාලන විද්‍යාව තෝරාගත් එතුමා, සාර්ථකව සිය අධ්‍යාපනය නිමා කළේය. 1971 දී තරුණ සන්නද්ධ කැරැල්ල මර්දනය කරන්නට සිදුවීමෙන් ද, අත්හදා බලමින් සිටි රාජ්‍ය ව්‍යවසායවාදී සංවෘත ආර්ථික ක්‍රමයේ අසාර්ථකභාවය නිසාද, පීඩාවට පත්ව සිටි ජනතාව අතර තම පවුලේ දේශපාලන පක්ෂයත් ආණ්ඩුවත් අප්‍රසාදයට පත්ව තිබියදී ඔහු පක්ෂයේ තරුණ අංශය ගොඩනැගීම බාරගත්තේය. 1974 සිට 1977 දක්වා ම ආර්ථික කටයුතු හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ උපදේශකවරයෙකු ලෙස ක්‍රියා කළ එතුමා, ශ්‍රී ල නි ප ය ට දරුණු පරාජයකට මුහුණ දෙන්නට සිදුවූ 1977 මහ මැතිවරණයේ දී, නුවර එළිය මස්කෙලිය දෙවන මන්ත්‍රීවරයා ලෙස බහු ආසනයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්විය. 1981 දී වෙනම දේශපාලන කණ්ඩායමක් ලෙස ශ්‍රී ල නි ප යෙන් (ශ්‍රී ල නි ප මෛත්‍රී පිල) වෙන් වී සිට, යලි පක්ෂයට එකතු විය. 1983 දී 6 වන ව්‍යවස්ථා සංශෝධනය හේතුවෙන්, එවකට විපක්ෂය වශයෙන් ක්‍රියාකළ, විපක්ෂයේ බහුතර ආසන සංඛ්‍යාවක් හිමිව සිටි, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ, පාර්ලිමේන්තුවෙන් පිටමං කැරුණු අවකාශය තුළ ඔහු විපක්ෂ නායකයා හැටියට පත්විය. 1992 දී යලිත් වතාවක් පක්ෂයේ. එනම් පවුලේ අභ්‍යන්තර හැලහැප්පීම් නිසා ශ්‍රී ල නි ප යෙන් ඉවත් වී එතුමා එක්සත් ජාතික පක්ෂයට එකතු විය. වසර 2000 දී ඒකඡන්දයෙන් පාර්ලිමේන්තු කථා-නායකවරයා ලෙස පත් වූ එතුමා, බැරෑරුම් අභියෝගවලට මුහුණ දෙමින්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ විශිෂ්ඨම කථා-නායකවරයා ලෙස සම්භාවනාවට පත්විය. පසුව, 2001 දී යලිත් ශ්‍රී ල නි ප යට එකතු වී ගම්පහ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්විය. ඉන් පසු විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙසත් පසුව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා යටතේ සංචාරක ඇමතිවරයා ලෙසත් ජාතික උරුම අමාත්‍යවරයා ලෙසත් විවිධ දේශපාලන අවහිර කිරීම් මැද කටයුතු කළේය. ලංකාවේ හැටියට, ඔහුගේ දේශපාලන භාවිතය එතරම් දිගු නොවූවද, එය නිතර ගැටුම් හා හැලහැප්පීම් වලින් වර්ණවත් වූ එකක් විය. එය ඔහුගේ දේශපාලන දැක්ම හා විශ්වාසය සමග බැඳී ඇති බව පෙනේ.

තමන් වාසය කළ රටේ ජනසමාජයේ ගෑවී නො ගෑවී සිටිමින්, සම්භාව්‍ය විශ්ව සමාජය තුළ ජීවත් වූ අනුර බණ්ඩාරනායක මහතා පිළිබඳව ඔහුගේ ජනතාවටත් ඒ ජනතාව ගැන ඔහුටත් ප්‍රමාණවත් අවබෝධයක් තිබුණේ නැත. එය පොදුවේ රටේත්

24 වන පිටුවට